# බළන්ගොඩ නගර සභාව

## 2021-05-06 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2021.05.06**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්.ටී.එම්.රුමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රි | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රි | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රි | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රි | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රි | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රි | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රි | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රීනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 16. ගරු නාගරික මන්ත්‍රි | කේ. ජී. පේමදාස මැතිතුමා |
| 17. ගරු නාගරික මන්ත්‍රීනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය |

**නිළධාරි සහභාගීත්වය**

1. ලේකම් එස්.එච්.ඒ.කරුණාරත්න මිය

**01. පසුගිය මහ සභා වාර්තාව, හා විශේෂ සභාවේ සභා වාර්තා සභා සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, සභාව සඳහා සහභාගි වූ ගරු උප සභාපතිතුමා, මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගැනීමෙන් අනතුරුව 2021-04-06 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් 2021-04-06 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා විසින් මෙදින සභා වාර්තාවේ සංශෝධනයන් තිබේදැයි විමසූ අවස්ථාවේදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් තමන් පසුගිය මහ සභාවේදී ඉදිරිපත් කළ 05ඃ01ඃ44 යෝජනාව සඳහා තමන් විරුද්ධ වූ අතර එය සටහන්ව නොමැති බැවින් එය සටහන් කරන ලෙස පවසන ලදී.

**ඒ අනුව ඉහත සංශෝධනයන්ට යටත්ව සභා වාර්තාව ගරු සභාවේ සම්මත විය.**

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

- අද දින ගරු සභාව පැවැත්වීම සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂක වරුන්ගේ සංගමය විසින් උපදෙස් මාලාවක් නිකුත් කරමින් ලිපියක් ඉදිරිපත් කර ඇති බැවින් ඒ අනුව සභාවේ කටයුතු සිදු කළ යුතු බව පවසන ලදී. එනම්,
    - ✓ අවම කාලයක් තුළ රැස්වීම අවසන් කළ යුතුය.
    - ✓ සෑම විටම මීටර් 1 1/2ක පරතරයක් තබා ගත යුතුය.
    - ✓ දෑත් සේදීම, මුඛ ආවරණ පැළඳීම, හොඳින් වාතාශ්‍රය ලැබෙන පරිදි දොර ජනෙල් විවෘත කර තැබිය යුතුය.
    - ✓ ශරීර උෂ්ණත්වය මැන බැලිය යුතුය.
    - ✓ කැස්ස සෙම්ප්‍රතිශ්‍යාව ස්වශන රෝග පවතින අය සහභාගි නොවිය යුතුය.
    - ✓ රැස්වීම පවතින අතරතුර ආහාර පාන ගැනීමෙන් වැළකිය යුතුය.

- අද දින සභාවේ වැඩ කටයුතු අවම කාලයක් තුළ අවසන් කළ යුතුව ඇති අතර ගරු ආණ්ඩුකාරතුමාද ලිපියක් මගින් ඒ බව දැනුම් දී ඇති අතර මේ වන විට කොවිඩ් 19 අවධානම වැඩි බවද දින 06කට පෙර කරන ලද පී සී ආර් සාම්පල වල ප්‍රතිඵල ඊයේ දිනයේ ලැබී ඇති බවද එතරම් පසුගාමී තැනක අපේ රට පවතින බවද පවසන ලදී. එබැවින් ඉතා අවධානම් තත්ත්වක

රාජකාරිවල යෙදිමට සිදුව ඇති බවද ඉදිරි මාසයේදී මහජනතාගේ සේවාවන් අඛණ්ඩ හා කාර්යක්ෂමව කරගෙන යාමට අවශ්‍ය තීන්දු තීරණ ගැනීමට අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

- අද දින සභාව සඳහා සහභාගී වූ නවක මන්ත්‍රීවරිය වන මංගලිකා ඉලංකෝන් මැතිතුමිය ගරු සභාව වෙත ඉතා ගෞරවයෙන් යුතුව පිළිගන්නා බවද ප්‍රකාශ කරන ලදී.

**03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම**

- පවත්නා කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් බළන්ගොඩ නගරයට පැමිණෙන රථ වාහන වල අඩුවක් දක්නට ලැබෙන බැවින් නගර සභාවට ගෙවීමට ඇති රථ වාහන ගාස්තුව සඳහා සහනයක් ලබා දෙන ලෙසද  ගෙවීමට ඇති හිඟ වාරික සඳහා දඩ මුදලක් අය නොකරන ලෙසද රථ වාහන ටෙන්ඩර්කරු වන වී.සී.එස්.වීරසේකර මහතා විසින් එවා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා විසින් බස්නැවතුම්පලට බස්රථ පැමිණීමේ අඩුවක් දක්නට ලැබෙන නමුත් ඕනෑම පුද්ගලයෙකු නගරට වෙත පැමිනෙන්නේ තම වාහන වලින් බැවින් නගරයට රථ වාහන පැමිණීමේ අඩුවක් දක්නට නොලැබෙන බවද පවසන ලදී.

  මෙහිදී ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ පසුගිය දින පැවති කොරෝනා කමිටුවේදී සාකච්ඡා කළ ගත් පරිදි ඉදිරියේදී අත්‍යවශ්‍ය වෙළෙඳසැල් හැර ඉතිරි වෙළෙඳසැල් කිසියම් ක්‍රමවේදයකට අනුව විවෘත කර තබා නගරයට පැමිණෙන මහජනතාව අවම කිරීමට බලාපොරොත්තු වන බවද ඉදිරි සතියේ සිට කොවිඩ් 19 රෝගය පහව යන තෙක් බළන්ගොඩ මහජන පොළ සෙනසුරාදා දිනයන්හිදි පැවැත්වීමට බලාපොරොත්තු වන බවද පවසන ලදී.

04. ටෙන්ඩර්පත් හා මිළ ගණන් විවෘත කිරීම.

**04:01 ZA -5039 JCB** යන්ත්‍රය 2021/2022 වර්ෂ සඳහා රක්ෂණය කිරීමට අදාළ මිළ ගණන් විවෘත කිරීම.

මෙදිනට නියමිත ටෙන්ඩර්පත් විවෘත කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාළ ටෙන්ඩර්පත් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමියගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ZA -5039 JCB යන්ත්‍රය 2021/2022 වර්ෂ සඳහා රක්ෂණය කිරීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව ආයතන තුනකින් මිළ ගණන් ඉදිරිපත් කර තිබූ අතර ඉදිරිපත් කර ඇති අවම මිළ හා ලබා දෙන ලද ප්‍රතිලාභ අනුව රු.104,415.75 ක මුදලක් ඉදිරිපත් කර තිබූ සමූපකාර රක්ෂණ සමාගම තෝරා ගැනීමට සුදුසු බව ටෙන්ඩර් මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

ඉහත සඳහන් ටෙන්ඩර් මණ්ඩල තීරණය ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05. කල් දී ඇති යෝජනා**

**05ඃ01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා**

05ඃ01ඃ01 කාර්යාලයේ සීසීටීවී සඳහා කැමරා 16 ක සීසීටීවී ඩීවීආර් සවිකිරීම සඳහා රු.55500.00 ක මුදල අනුමත කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ දැනට සීසී ටීවී කැමරා පද්ධතියේ සී සී ටීවී කැමරා අටක් පවතින අතර පුස්තකාලයේ මාලු ටැංකියේ පවතින භාණ්ඩ හොරකම් කර ඇති අතර ඒ පිළිබඳව සොයා බැලීමට හෝ එම ස්ථානයේ කැමරා පද්ධතියක් නොමැති බැවින් පුස්තකාලය සඳහා සවි කිරීම සඳහා මෙන්ම වෙනත් ස්ථාන සඳහා සවිකිරීම සඳහා කැමරා 03 ක් අවශ්‍යව ඇති බවද ඒ සඳහා අවශ්‍ය කරන ඩීවී ආර් එකක් ගත යුතුව ඇති බවද පවසන ලදී.

මෙහිදී ගරු සභාවේ මතය වූයේ දැනට ක්‍රියා විරහිත වී ඇති ඩී වී ආර් යන්ත්‍රය අලුත්වැඩියා කිරීමටත්, භාණ්ඩ නැතිවීමේ වගකීම මුරකරුට ලබා දීමටත් මෙය ලබා ගැනීම අවශ්‍ය නොවන බවටත් තීරණය විය.

05ඃ01ඃ02 බැංකියවත්ත කොම්පෝස්ට් අංගනය සඳහා අවශ්‍ය පහත සඳහන් ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

- බූට්ස් ජෝඩු 20
- ග්ලවුස් ජෝඩු 20
- මාස්ක් පෙට්ටි 03

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:03 RE-2600 ට්‍රැක්ටර් රථයේ රේඩියේටරය සිසිල් කරන ෆෑන් පෙති අලුතින් දැමීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:04 ND-5124 වෑන් රථයේ පිටුපස රිවස් කැමරාව ක්‍රියා විරහිත වී ඇති බැවින් පරීක්ෂා කර බලා අලුතින් දැමීම සහ මැද කාපට් අලුතින් දැමීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:05 RC-1118 ට්‍රැක්ටර් රථය සඳහා 90 Amp 12V 95 AH Lucas බැටරියක් මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිළගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති චමින්ද බැටරි මාට් ආයතනයේ රු.21850.00 ක මිළ ගණන අනුමත කර අදාළ ආයතනයෙන් එම සේවාව ඉටු කර ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:06 RC-8183 ට්‍රැක්ටර් රථයේ පහත සඳහන් අලුත්වැඩියාවන් ඉටු කිරීම සඳහා තෙඹුවන ගරාජ් වෙතින් ඉදිරිපත් කර ඇති රු.14,100.00 ක මිළ ගණන අනුමත කර අදාළ ආයතනයෙන් එම සේවාව ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

01. ට්‍රැක්ටර් රථයට බ්‍රේක් හබ් දෙකක් අලුතින් දැමීම සඳහා - රු.11,800.00

02. ඕවර් සියර් දෙකක් අලුතින් දැමීම සඳහා - රු.2,300.00

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ07 56-1906 කෘෘ කැබ් රථයේ පහත සඳහන් අලුත්වැඩියාවන් ඉටු කිරීම සඳහා නැෂනල් මෝටර්වේස් ආයතනයෙන් ඉදිරිපත් කර ඇති රු.43,250.00 මිළ ගණන අනුමත කර අදාළ ආයතනයෙන් එම සේවාව ඉටු කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

01. රේඩියේටර් මූඩිය සවිවන හෙඩ් එකට සම්බන්ධ වතුර කට සපයා සවි කිරීම - රු.14,750.00
02. පවර් ස්ටියරින් පම්ප් මෙටල් හෝස් සපයා සවි කිරීම. - රු.6,500.00
03. ෆුට් බෝඩ් දෙක සපයා සවි කිරීම - රු. 22,000.00

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ08 කාර්යාලීය අවශ්‍යතා සඳහා අවශ්‍ය පහත සඳහන් ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| ද්‍රව්‍ය | ප්‍රමාණය |
|---|---|
| A4 Paper | 50 |
| Half Sheet | 10 |
| Mask | 15 Box |
| Glause | 15 Box |
| CR I | 15 |
| Face Shield | 235 |
| ලොකු සෙලෝටේප් | 50 |
| ලොකු ලියුම් කවර | 100 |
| ලෙදර් ෂීට් | 50 |
| ලීගල් කොළ | 05 |
| විම් | 50 |
| ග්ලාස් ක්ලීනර් | 10 |
| ඉදල් | 50 |
| බූට්ස් | 10 |
| එතනෝල් | ලී.90 |
| සැනිටයිසර් | කෑන් 10 |
| සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් | ලී.500 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:09 පොදු වැසිකිළි වලින් අය කරන ගාස්තුව සංශෝධනය කිරීම පිළිබඳ සභා තීරණයක් ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමන් පවසා සිටියේ පවත්නා කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ නගරය වෙත පැමිණෙන ජනතාව අඩු බැවින් පොදු වැසිකිළිවලින් අය කරන ගාස්තුව රු.10 සිට රු.20 දක්වා වැඩි කිරීමට අවසර ලබා දෙන ලෙස පොදු වැසිකිළි ටෙන්ඩර්කරු විසින් ඉල්ලීමක් කර ඇති බවයි.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රීනී පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් බස්නැවතුම්පල ඉහළ මාලයේ ඇති පොදු වැසිකිළිය ඉතාමත් අපවිත්‍ර බැවින් එහි අඩුපාඩු සකස් කර අලුත්වැඩියා කර දෙන ලෙස පවසන ලදී.

නැවත වරක් අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ මෙම ටෙන්ඩර්කරු විසින් සිදු කරන ලද ඉල්ලීම පිළිබඳ නීත්‍යානුකූල තීරණයක් ගැනීමට නොහැකි වන්නේ සභාව විසින් මෙම වසරේ ගැසට් කරන ලද්දේ රු.10.00 ක මිළට බැවින් බවයි.

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් මෙම වසරේ මුල සභාව විසින් ගැසට් නිකුත්කරන අවස්ථාවේදී රටේ මෙවැනි තත්ත්වයක් බලාපොරොත්තු නොවූ අතර මෙම ටෙන්ඩර්කරු සිදු කරන්නේ සාධාරණ ඉල්ලීමක් බැවින් මේ පිළිබඳව සළකා බැලීම සුදුසු බව පවසන ලදී. එමෙන්ම මෙතුමිය ටෙන්ඩරය ක්‍රියාත්මක කිරීම පිළිබඳ කිසිඳු චෝදනාවක් නොමැති බවද කඩ හිමියන් මෙම වැසිකිළිය භාවිතා කළද මුදල් නොගෙවන බවද  පවසන ලදී.

මේ පිළිබඳව කරුණු පැහැදිලි කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමියගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

ලේකම්තුමියගේ කරුණු පැහැදිලි කිරීමෙන් අනතුරුව ගරු සභාපතිත-මාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

කාරක සභාවේදී සිදු වූ සාකච්ඡාවෙන් අනතුරුව  නෛතික භාවයේ ගැටලුවක් පවතින බැවින් මෙසේ පොදු වැසිකිළිවලින් අය කරන ගාස්තුවේ සංශෝධනයක් සිදු කළ නොහැකි බැවින් අදාළ ටෙන්ඩර්කරුගෙන් 2021 මැයි හා ජූනි මාසයන්හිදී අය කරන ටෙන්ඩර් මුදලින් 50%ක් පමණක් අය කිරීම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රාමාරච්චි මැතිතුමා විසින් සිදු කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ10 පහත සඳහන් නිළධාරීන්/ සේවකයින් සඳහා කාර්යසාධන ණය හා ආපදා ණය ලබාදීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

**කාර්යසාධන ණය**

එම්.රොෂාන් ප්‍රනාන්දු මයා - රු.100,000.00

මධුෂාණි ආනන්ද මිය - රු.100,000.00 හා රු.500,000.00 ක මුදලකට යටත්ව ණය ගෙවීම.

**ආපදා ණය**

නදිකා සුභාෂණී විමලදාස මිය

කෝසල තිළිණ අංජු මයා

නදීකා හර්ෂණී මිය

එම්.ඩී.එස්.ප්‍රනාන්දු මයා

ඩී.සෙල්ව කුමාර මයා

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ11 ලංකා ධීවර සංස්ථාවට අයත් රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය මඟින් රත්නපුර දිස්ත්‍රික්කය තුළ පිහිටුවීමට යෝජිත මෙගා සුපිරි මසුන් වෙළෙඳසැල බළන්ගොඩ නගර තුළද පිහිටුවන බැවින් ඒ සඳහා අංක 90, පරණ පාර බළන්ගොඩ ලිපිනයෙහි හිමිකරු වන උඩවත්ත ධර්මසේන මහතා විසින් එකඟ වී ඇත. ඒ අනුව ධීවර සංස්ථාවේ මසුන් වෙළෙඳසැල එම ස්ථානයේ පවත්වාගෙන යාම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සඳහා දැඩි කොන්දේසි යොදා ගිවිසුම් සකස් කර අතුරු ව්‍යවස්ථාවක් සකස් කර වාර්ෂික බලපත්‍රයක් ලබා දීමේ පදනම මත ලබා දීම සුදුසු බව සභාවේ මතය විය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ12 පොදු වෙළෙඳසැල අංක 17 දරණ කඩ කාමරය හා අංක 03 දරණ කඩ කාමරය ටෙන්ඩර් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම හා අවම ලංසු මුදල තීරණය කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ අංක 17 දරණ කුකුල් මස් කඩ කාමරයේ මාසික කුළිය ගෙවා නොමැති බැවින් මෙම කඩ කාමරය මුද්‍රා තබා ඇති අතර පොදු වෙළෙඳසැල අංක 03 කඩ කාමරය ගියවර ටෙන්ඩර් නොවීම නිසා නැවත ටෙන්ඩර් කිරීමට සිදුව ඇති බවයි.

පොදු වෙළෙඳසැල අංක 03 කඩ කාමරයේ පවතින අඩුපාඩු සකස් කර පසුගිය වර ටෙන්ඩර් කළ රු.6,000.00 මුදල අවම ලංසු මුදල ලෙස යොදා ටෙන්ඩර් කිරීමටත් බුදු මැඳුර ඉදිරිපිට කුකුල් මස් කඩ දෙක වසා කුකුල් මස් කඩ කාමරය පසුගිය වර ටෙන්ඩර් මුදල වන රු.20,250.00 ක මුදල යොදා ටෙන්ඩර් කිරීම සුදුසු බව සභාවේ මතය විය.

ඒ අනුව පොදු වෙළෙඳසැල අංක 03 දරණ කඩ කාමරය රු.6000.00 ක අවම ලංසු මුදලක් යොදා ටෙන්ඩර් කිරීමත් පොදු වෙළෙඳසැල අංක 17 දරණ කුකුල් මස් කඩ කාමරය රු.20,250.00 ක අවම ලංසු මුදලක් යොදා විවෘත ටෙන්ඩර්පත් කැඳවීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ13 බළන්ගොඩ නගරය තුළ පවතින ටිකට් කුඩුවලින් දිනකට රු.50.00 ක මුදලක් අය කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ මෙමගින් සභාවට මසකට රු.1500.00 ක මුදලක් ලැබෙන අතර ඒ සඳහා ටිකට් කුඩු හිමියන්ද කැමැත්ත පළ කර ඇති බවයි.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් මෙසේ ටිකට් කුඩුවල සිටින වෙළෙඳුන්ට වඩා ජංගම වෙළෙඳාමේ නිරතවන ටිකට් වෙළෙන්ඳන් ටිකට්පත් වෙළෙඳාම් කරන බැවින් මෙසේ අය කිරීම අසාධාරණ බව පවසන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමා අදහස් දක්වමින් ජංගම ටිකට් වෙළෙඳුන් පදික වේදිකාව අවහිර කරගනිමින් වෙළෙඳාම් නොකරන අතර ටිකට් කුඩු සියල්ල ඇත්තේ පදික වේදිකාව මත බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ ටිකට් කුඩු නිසි තැන් වල ස්ථාන ගත කළ යුතු අතර මෙසේ මුදල් අය කිරීම පදික වේදිකාව අවහිර කිරීමට පිළියමක් නොවන බවයි.

මෙම ලොතරැයිපත් කුඩු රජයට අනුබද්ධිත බැවින් හා රජයට ආදායම ලැබෙන බැවින් එසේ ඉවත් කිරීමට රජය අවසර නොදෙන බව ගරු සභාපතිතුමන් විසින් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් මෙය අනවසර වෙළෙඳාමක් බැවින් හා ලොතරැයිපත් හරහා රජයට ආදායමක් පැමිණෙන බැවින් මෙසේ ටිකට් කුඩුවලින් මුදල් අය කිරීම පිළිබඳ තමන් විරුද්ධවන බව පවසන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මෙසේ අය කිරීම අප සභාව මඟින් පමණක් සිදු කරන දෙයක් නොවන අතර අය නොකර සිටිය වුවද සභාවට විශේෂ ප්‍රසාදයක් හිමි නොවන බව පවසන ලදී.

අනතුරුව සභාවේ සිදු වූ දීර්ඝ සාකච්ඡාවෙන් අනතුරුව මේ සඳහා එකඟ නොවීමට තීරණය විය.

05:01:14 මෝටර් ග්‍රේඩරය/ ගල්රෝල කුලියට දීමේ ක්‍රමවේදය පිළිබඳව සභා තීරණයක් ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ ඉදිරි කාලයේදී කල්තොට පාර, රාස්සගල පාර ආදී ස්ථානවල විශාල වැඩ කොටසක් සිදු කිරීමට නියමිත බැවින් ඒ සඳහා මොටර් ග්‍රේඩරය හා ගල් රෝල කුලියට ලබා දීමට සිදුවන අතර මෙම වාහන දෙක සඳහා වාර්ෂිකව විශාල මුදලක් ඉන්ෂුවරන්ස් සඳහා වැය වන බවද සභාවේදී සෑම දිනකම තිකරුනේ මේ සඳහා ප්‍රශ්නයක් ඇති වන අතර මෙම යන්ත්‍ර සඳහා නඩත්තු වියදම් දැරීම පමණක් සිදුවන බැවින් සභාවට ආදායම් ලැබෙන ලෙස සකස් කරන ලෙස පවසන ලදී.

මෙම යන්ත්‍රෝපකරණ දෙක කුලියට දීම පිළිබඳ කරුණු පැහැදිලි කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

මෙම කරුණු පැහැදිලි කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමියගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

කාරක සභාවේදී සාකච්ඡාවූ පරිදි මොටර් ග්‍රේඩර ක්‍රියාකරු වශයෙන් බඳවා ගැනීම සඳහා මීට ඉහතදී සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසුකම් සළකා බැලූ 762, දේගපිටිය, කිරිදිගල, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි කේ.ඒ.චමින්ද ලක්රුවන් බණ්ඩාර යන අය පළාත් සභාවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු බඳවා ගැනීමටත් සභාව මගින් ගැසට් කරන ලද මිළ ගණන් වලට අනුකූලව වැටුප් ලබා දීමටත් සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් සිදු කරන ලද යෝජනාව ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දක්වමින් මෝටර් ග්‍රේඩරය කුළියට ලබා දෙනුයේ මාර්ගයක් සකස් කිරීමේදී කොන්ත්‍රාත් සමාගමකට බැවින් මේ සඳහා විශාල කාලයක් ගත වන බවද එබැවින් සභාවේ නිළධාරියෙක් ධාවන සටහන් පරීක්ෂා කිරීම සඳහා යෙදවිය යුතු බවද එමෙන්ම ඉන්ධන ලබා දීම ආදිය පදනම් කර ගනිමින් ගාස්තුව තීරණය කරන ලෙසද පවසන ලදී. එමෙන්ම මෙය ලබා දීමේදී ගිවිසුමක් මගින් නීත්‍යානුකූලව ලබා දිය යුතු බව ද දුර බැහැර ප්‍රදේශවල ගිය අවස්ථාවන්හිදී එය පරීක්ෂා කිරීමට නොහැකි බැවින් මීටරය ගලවා ධාවනය කළ හැකි බවද පවසන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ නාස්තිය දූෂණ වංචාවලින් තොරව මෙය ඉටු කිරීමට තමන් කටයුතු කරන බවද ලබන සභාවාරයේදී අදාළ ගිවිසුම් කෙටුම්පත සකස් කර සභාව වෙත ඉදිරිපත් කරන බවද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය අදහස් ඉදිරිපත් කරමින් එම ස්ථානයට නිතර ගොස් මීටරය පරීක්ෂා කිරීමේ ගැටලුව පවතින බැවින් මේ සඳහා ජීපීඑස් කට්ටලයක් සවි කිරීම සුදුසු බව පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05෴01෴15 2021 මැයි මස කර්මාන්ත අංශය මගින් ඉටු කිරීමට නියමිත කර්මාන්ත සඳහා සභා අනුමැතිය ලබා ගැනිම.

1.පල්ලෙකුඹුර මාර්ගය තාර යෙදූ කොටස නඩත්තු කිරීම .

2.බෝම්බුව පෙරපාසලේ බිත්තිවල සහ ඩෙස්ක් පුටුවල තීන්ත ආලේප කිරීම.

3.සඳුන්ගම ධනසිරි මහතාගේ නිවසට යන මාර්ගයේ කාණුවල පස් ඉවත් කිරීමට ජේ.සී.බී.යන්ත්‍රය ලබාදීම.

4. බෝම්බුව ප්‍රජාශාලාවේ ආර්ථික සංවර්ධන නිළධාරි කාර්යාලය සඳහා කොටසක් ලෑලි ගසා වෙන්කර දීම.

**මෙම කර්මාන්ත සඳහා අවශ්‍ය කම්කරුවන් ප්‍රමාණය**

දිනකට සේවකයන් 15 බැගින් දින 25 කට කම්කරුවන් 375ක් අවශ්‍ය වේ.

**මෙම කර්මාන්ත සඳහා අවශ්‍ය රථවාහන**

| | |
|---|---|
| ටිපර් රථය | දින 25 |
| ට්‍රැක්ටර් රථය | දින 25 |
| D/D රෝල | දින 15 |
| JCB යන්ත්‍රය | පැය 50 |

**මෙම කර්මාන්ත සඳහා අවශ්‍ය ද්‍රව්‍ය**

| ද්‍රව්‍ය | අවශ්‍ය ප්‍රමාණය | ඒකකයක මිල රු. | සම්පූරණ මිල රු. |
|---|---|---|---|
| 1 1 /2 ගල් කියුබ් | 05 | 6800.00 | 34000.00 |
| චිප් ගල් කියුබ් | 05 | 6500.00 | 32500.00 |
| වැලි කියුබ් | 03 | 10900.00 | 32700.00 |
| එකතුව | | | 99200.00 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

කර්මාන්ත කමිටුව මඟින් ඉටු කරනු ලබන කර්මාන්තවල ප්‍රගතිය විමසීම හා අඩුපාඩු සාකච්ඡා කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

වැඩ අධිකාරිතුමාගේ හා ගරු සභිකවරුන්ගේ සාකච්ඡාවෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමියගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ16 බළන්ගොඩ නගර සභා තානායම් ටෙන්ඩර්කරු විසින් කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ සෞඛ්‍ය අමාත්‍යාංශය හා කොවිඩ් මර්ධන කමිටුව විසින් ඉදිරිපත් කර ඇති උපදෙස් අනුව ව්‍යාපාර කරගෙන යාමට නොහැකි තත්ත්වයක් උද්ගත වී ඇති බැවින් තානාසම් පරිශ්‍රය තාවකාලිකව වසා දැමීම හෝ සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස ඉල්ලා ඇත. මේ පිළිබඳව සභා තීරණයක් ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ පවත්නා කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති මාර්ගෝපදේශයන්ට අනුකූලව බළන්ගොඩ නගර සභා තානායම වසා දැමීමට අදාළ ටෙන්ඩර්කරු විසින් ඉල්ලීමක් කර ඇති බවයි.

එතුමාගේ ඉල්ලීම සාධාරණ බැවින් ඒ සඳහා අවසර ලබා දීම සුදුසු බව ගරු සභාවේ මතය විය.

අනතුරුව සභාවේ සිදු වූ සාකච්ඡාවෙන් අනතුරුව මෙහි පවත්නා අලුත්වැඩියාවන් පිළිබඳව ද දැනුවත් කර මේ පිළිබඳව පළාත් සභාව දැනුවත් කර එයින් ලබා දෙන උපදෙස් පදනම් කරගනිමින් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දක්වමින් සභාව මගින් ගන්නා බොහෝමයක් තීන්දු තීරණ පළාත් සභාව වෙත යොමුකර උපදෙස් ඉල්ලා සිටින අතර ටෙන්ඩර්කරු විසින්ම මෙය වසා දමන ලෙස පවසන්නේ නම් සභාවට මේ පිළිබඳව තීන්දුවක් ගැනීමට නොහැක්කේ මන්දැයි විමසන ලදී.

එබැවින් අදාළ ටෙන්ඩර්කරුගේ සාධාරණ ඉල්ලීම මත මෙය ඉදිරි මාස දෙකක කාලයක් තුළ වසා දැමීම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා සිදු කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමා පවසා සිටියේ මෙම ටෙන්ඩර්කරු විසින් මෙය වසා දැමීම හෝ සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස පවසා ඇති බැවින් ගරු සභිකවරුන්, අදාළ සභාවේ නිළධාරීන් හා අදාළ ටෙන්ඩර්කරු සමග සාකච්ඡාවක් පවත්වා තීරණයක් ගැනීම සුදුසු බවයි.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ අදාළ ටෙන්ඩර්කරු ලිපිය භාර දීමට පැමිණි අවස්ථාවේදී තමා සමග මේ පිළිබඳව සාකච්ඡා කළ අතර එතුමාගේ ඉල්ලීම වූයේ මෙය වසා දැමීම සඳහා අවසර ලබා දෙන ලෙස බවයි.

මේ පිළිබඳව ගරු සභාවේ සිදු වූ සාකච්ඡාවෙන් අනතුරුව ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා විසින් කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් තානායම්

පවත්වාගෙන යාමට හැකි ලෙස චක්‍රලේඛ නිකුත් කරන තෙක් වසා දැමීම සුදුසු බවට කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05෴01෴17 පොදු වෙළෙඳසැල පිටුපස කාණුව නඩත්තු කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05෴01෴18 කාර්යාලීය වාහන වලට සවිකිරීම සඳහා අවශ්‍ය පී.පී.එස් කට්ටල 10 ක් මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05෴01෴19 පෞද්ගලික අංශයේ විෂබීජහරණ ගාස්තු සංශෝධනය කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ විෂබීජහරණය කිරීමේදී එම පුද්ගලයා විසින් අඳිනු ලබන සනීපාරක්ෂක ඇඳුම් කට්ටලයක් සඳහා රු.500.00 ක් වැනි මුදලක් වැය වන අතර එක් අයෙකු පාවිච්චි කළ ඇඳුම් කට්ටලයක් නැවත වෙනත් පුද්ගලයෙකු පාවිච්චි කිරීමට අකමැත්තක් දක්වන බැවින් එක් වරක් පමණක් භාවිතා කළ හැකි එම ඇඳුම් කට්ටලය මිළදී ගැනීම ඒ සඳහා වැය වන ගාස්තුව ඇතුළත් කර මේ වන විට පෞද්ගලික අංශයෙන් අය කරන රු.1500.00 ගාස්තුව රු.2000.00 දක්වා වැඩි කිරීමට අනුමැතිය ලබා දෙන ලෙස පවසන ලදී.
ගරු නාගිරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දක්වමින් මුදල් අය කිරීමේදී විෂබීජහරණය සිදු කිරීමට අවශ්‍ය වර්ග මීටර් ප්‍රමාණය පිළිබඳවද සැලකිලිමත් වී මුදල් අය කරන ලෙසද එසේ අය කිරීම සාධාරණ බවද පවසන ලදී.

ගරු සභාපතිතුමා අදස් දක්වමින් විෂබීජහරණයට යන වියදම එක සමාන වන අතර දියරයේ ගාස්තුව පමණක් වෙනස්වන බැවින් රු.2000.00 දක්වා වැඩි කිරීම ප්‍රමාණවත් බව පවසන ලදී.

ඒ අනුව පෞද්ගලික අංශයෙන් විෂබීජහරණය සඳහා අය කරන මුදල රු.1500.00 සිට රු.2000.00 දක්වා වැඩි කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ20 RW 1962 ට්‍රේලරයේ පහත සඳහන් අලුත්වැඩියාවන් ඉටු කිරීම සඳහා තෙබුවන ගරාජ් වෙතින් ඉදිරිපත් කර ඇති රු. 225,050.00 ක මිළ ගණන් අනුමත කර අදාළ ආයතනයෙන් එම සේවාව ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

01. සනකම මිලි 02 තහඩු සීට් 07 ක් දැමීම - රු.100,100.00

02. දොරවල් පහ සහ ඉදිරිපස ඇන්ද, තහඩු ටික නැවීම සඳහා - රු.9500.00

03. සරනේරු 13ක් දැමීම - රු.8450.00

04. අඟල් 3 සහ 1 1/2 යූ ජැනල් දෙකක් දැමීම - රු.16,000.00

05. අඟල් 3 , 1 1/2 බොක්ස් බාර් 01 ක් දැමීම - රු.6,000.00

06. සම්පූර්ණ ටේලරය පින්තාරු කිරීම සඳහා - රු.35,500.00

07. වැඩ කුලිය සඳහා - රු.49,500.00

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ21 25 Kg පොහොර කවර 2000 ක් පිටත කවරය, කවර මුද්‍රණය සහ ලිනරය සමඟ මිළදී ගැනීම සඳහා සීගිරි ප්‍රින්ටර්ස් ආයතනයෙන් ඉදිරිපත් කර ඇති රු.82.00 (එකක මිළ) මිළ ගණන අනුමත කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ22 ගරු සභිකවරුන්ගේ දීමනා, කාර්යාලීය නිළධාරීන්ගේ/සේවකයින්ගේ අතිකාල දීමනා හා ගමන් වියදම් ගෙවීම හා හදිසි වාහන අලුත්වැඩියා කිරීම්, හදිසි යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියා කිරීම් සඳහා ආවරණ අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

පළාත් සභාව මඟින් පවසා ඇත්තේ සියලු දේ සඳහා පූර්ව අනුමැතියක් ලබා ගැනීමෙන් පසු ක්‍රියාත්මක කිරීමට බැවින් මේ සඳහා අවසර ලබා දීම නුසුදුසු බව සභාවේ මතය විය.

05ඃ01ඃ23 බොබ්කැට් යන්ත්‍රය සඳහා අවශ්‍ය ටයර් 04 ක් ලබා ගැනීමට නියෝජිත ආයතනය වන සී කොම් ආයතනයෙන් ඉදිරිපත් කර ඇති රු.594,000.00 මිළ ගණන පහත සඳහන් පරිදි අනුමත කර අදාළ ආයතනයෙන් එම සේවාව ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| | | | |
|---|---|---|---|
| Solid Tire | 04 | 130,000.00 | 520,000.00 |
| Installation Charges | 04 | 7,500.00 | 30,000.00 |
| Vat 8% | | | 44,000.00 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ24 දේශීය ණය සහ සංවර්ධන අරමුදල මඟින් බස්නැවතුම්පල සහිත වෙළෙඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා ලබා ගත් ණය වාරිකය ලෙස රු.769,680.36 මුදලක් ද, වැසි ජල කාණු පද්ධතිය ඉදි කිරීම වෙනුවෙන් ලබා ගත් ණය වාරිකය ලෙස රු.202,918.84 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ25 2021-05-06 දින සිට 2021-06-08 දක්වා සභාවේ සංග්‍රහ වියදම් ලෙස රු.50,000.00 ක මුදලක් වියදම් දැරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05៖01៖26 HF 8952 ට්‍රැක්ටර් රථයේ එන්ජිම අලුත්වැඩියා කිරීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05៖01៖27 රු.10000.00 ට වැඩි ගෙවීම් සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම.

- IM 2702 ෆොටෝ කොපි යන්ත්‍රයේ සේවා ගිවිසුම සඳහා රු.14,580.00 මුදල ගෙස්ට්ටේනර් ඕෆ් සිලෝන් පීඑල්සී ආයතනය වෙත ගෙවීම.
- කාර්යාලයේ එල් 140 ෆැක්ස් යන්ත්‍රයේ සේවා ගිවිසුම සඳහා රු.9612.00 ක මුදලක් මෙට්‍රොපොලිටන් ආයතනයට ගෙවීම.
- RD 8240 ට්‍රැක්ටර් රථය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් රිෂානා සර්විස් ස්ටේෂන් ආයතනය වෙත රු.21460.00 ක මුදලක් ගෙවීම.
- ZA-9835 ගලි බවුසරය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් නියෝජිත ආයතනය වන යුනයිටඩ් මෝටර්ස් ලංකා ආයතනය වෙත 32,751.52 ක මුදලක් ගෙවීම.
- 56-1906 කෘෂ කැබ් රථය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් කේ.ඒ.ඉන්ජිනියරින් හා කේ.ඒ.ඔටෝ ක්ලීන් ආයතනය වෙත රු.10,550.00 ගෙවීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම.
- 227-5020 ගලි බවුසරයේ පී.ටී.ඕ.එක ගලවා ඇඳවී ගිය සාප්ට් එක ඇඳ ඇර ඔයිල් සීල් එක අලුතින් දමා නැවත සවි කිරීම වෙනුවෙන් තෙබුවන ගරාජ් ආයතනය වෙත රු.13,500.00 ක මුදලක් ගෙවීම.
- 46-3164 ටේලරයේ හබ් එක, අලුත් රේසර් එකක් දැමීම, රෝද ඇණ පහක් දැමීම හා වැඩ කුලිය සඳහා රු.14,500.00 ක මුදලක් තෙබුවන ගරාජ් ආයතනය වෙත ගෙවීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05៖01៖28 රු.10,000.00 ට වැඩි ගෙවීම් සඳහා ආවරණ අනුමැතිය ලබා ගැනීම.

| දිනය | විස්තරය | වවුචර් අංකය | චෙක්පත් අංකය | මුදල රු. |
|---|---|---|---|---|
| 2021-03-23 | මොහොමඩ් මලික් - පොදු වෙළෙඳසැල අංක 16 කඩ කාමරය 2021 වර්ෂය වෙනුවෙන් තබන ලද ටෙන්ඩර් ඇප ආපසු ගෙවීම. | 107 | 049317 | 100,000.00 |
| 2021-04-01 | බී.විනෝදනී ප්‍රේමිකා - 2021-03-16 සිට 2021-03- | 02 | 049366 | 320,050.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 31 දක්වා බළන්ගොඩ නගරයේ කසළ ඉවත් කිරීම වෙනුවෙන් ගෙවීම. | | | |
| 2021-04-05 | මධ්‍යම පරිසර අධිකාරිය | 11 | 049370 | 12,450.00 |
| 2021-04-06 | Dialog Broadband Networks Pvt Ltd - 2021 පෙබරවාරි, මාර්තු මස දුරකථන බිල් ගෙවීම - කාර්යාලය, Internet bill, බැංකියවත්ත හා සම්පත් පියස බිල් ගෙවීම | 39 | 059060 | 18,389.80 |
| | ලංකා විදුලි බල මණ්ඩලය - 2021 මාර්තු මස කාර්යාලය, නගර සභා යාබද ගොඩනැගිල්ල, හෝරාස්ථම්භය විදුලි බිල් ගෙවීම | 45 | 059063 | 39,832.30 |
| 2021-04-07 | දෛනික වැටුප් ගෙවීම | 49-2 | | 62,450.00 |
| | දෛනික වැටුප් ගෙවීම | 49-3 | | 806,699.60 |
| | දෛනික වැටුප් ගෙවීම | 49-4 | | 344,061.36 |
| 2021-04-12 | බී.විනෝදනී ප්‍රේමිකා - 2021-04-01 දින සිට 2021-04-11 දක්වා නගරයේ කසළ ඉවත් කිරීම වෙනුවෙන් ගෙවීම. | 76 | 059106 | 234,703.34 |
| | සභාපති, අසරණ සරණ වැඩිහිටි සමිතිය - ගලපල්ලෙ අරාව කොළණිය මාර්ගයේ රැඳවුම් බැම්ම ඉදිකිරීමට අදාළව රැඳවුම් මුදල් හා කොන්ත්‍රාත් ගිවිසුම් ඇප මුදල් ගෙවීම. | 79 | 059109 | 265,518.46 |
| 2021-04-19 | ලංකා විදුලි බල මණ්ඩලය - 2021 මාර්තු මස බස්නැවතුම්පල විදුලි බිල ගෙවීම | 83 | 059113 | 29,597.80 |
| 2021-04-20 | ජාසින්කන්ද ගැමුණු වැඩිහිටි සමිතිය - කොටුගොඩැල්ල ගල්වල මාර්ගයේ අවශ්‍ය ස්ථාන පෙරනිමි මිශ්‍රන යොදා සංවර්ධනය කිරීම කර්මාන්තයේ 10% රැඳවුම් ගෙවීම | 97 | 059144 | 98,065.91 |
| | ශ්‍රී මුතු සුභසාධක සමිතිය - දෙහිගස්තලාව කුමාරගම මාර්ගයේ වැඩ අවසන් කරන ලද කර්මාන්තයේ 10% රැඳවුම් මුදල් ගෙවීම. | 98 | 059145 | 196,044.56 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:29 Yaarl Reisen (Pvt) Ltd ආයතනය මඟින් සංවිධානය කරනු ලබන නාගරික අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ වැඩසටහන -( වියට්නාමය) පිළිබඳ සභාවේ දැනුවත් කිරීම සහ ඒ සම්බන්ධව තීරණයක් ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05៖01៖30 2021-05-06 දින සිට 2021 ජූනි මස සභාව පැවැත්වෙන දින දක්වා කාර්යාලීය නිළධාරීන්ගේ අතිකාල දීමනා ලබා දීම සඳහා රු.300,000.00 ක මුදලක් වියදම් දැරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05៖01៖31 2021 ජූනි මස සහික දීමනා ලෙස රු.270,000.00 මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05៖01៖32 2021-05-06 දින සිට 2021 ජූනි මස සභාව පැවැත්වෙන දින දක්වා සභාවේ හදිසි වාහන අලුත්වැඩියා කිරීම සඳහා සහ හදිසි යන්ත්‍ර අලුත්වැඩියා කටයුතු සඳහා රු.200,000.00 ක මුදලක් වියදම් දැරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05៖01៖33 සරස්වතීවත්ත මාළිගාතැන්න මාර්ගයේ කාණු පද්ධතිය සංවර්ධනය කිරීම. (ලක්ෂ 15) - ඇල්ලෙපොල කොට්ඨාශය

05៖01៖34 පුපුලවත්ත මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීම (ලක්ෂ 04) - කුමාරගම කොට්ඨාශය

05៖01៖35 කුමාරගම විජයානන්ද මහතාගේ සහ තවත් අයගේ නිවාසවලට යන මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීම (ලක්ෂ 03) - කුමාරගම කොට්ඨාශය

05៖01៖36 පුපුලවත්ත දෙවන පටුමග ඉතිරි කොටස කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීම. (ලක්ෂ 02) - කුමාරගම කොට්ඨාශය

05៖01៖37 වැවේගෙදර මාර්ගයේ දෙවන පටුමගේ මාර්ගය සෝදාපාලුවට ලක්වන ස්ථානය සඳහා පැති බැම්මේ කොටසක් ඉදි කිරීම. - (ලක්ෂ 06) - කුමාරගම කොට්ඨාශය

යෝජනා අංක 05෴01෴33 සිට 05෴01෴37 දක්වා යෝජනා සභාවට ඉදිරිපත් කළ අවස්ථාවේදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් කර්මාන්ත කමිටුව වෙත **කොට්ඨාශයේ අත්‍යවශ්‍ය සංවර්ධන කටයුතු සඳහා එක් මන්ත්‍රීවරයෙකුට රු.1,500,000.00ක් ලබාදීම** ලෙස යෝජනාවක් ඉදිරිපත් කර තිබූ අතර එය නිර්දේශ වී තිබූ බැවින් ගරු සභිකවරුන්ගෙන් සංවර්ධන යෝජනා ගෙන්වා අද දින සභාව වෙත ඉදිරිපත් කළ බවයි.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් පවසා සිටියේ කර්මාන්ත කමිටුවේදී සාකච්ඡා වූයේ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ඉදිරිපත් කළ යෝජනාව ගරු සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සභාව මඟින් අනුමැතිය ගෙන අනතුරුව ලක්ෂ 15 යෝජනා ලබා ගැනීම සුදුසුයි යනුවෙන් බවය. එමෙන්ම තමන් එය කර්මාන්ත කමිටුවේ වාර්තාවේද සඳහන් කර ඇති බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් ගරු සභිකවරුන් සභාවට පැමිණ ඇත්තේ මහජනතාවට සේවය කිරීම සඳහා වුවද මෙම අවස්ථාවේදී නගර සභාවේ අයවැය පරාජය වී ගැටලුවක් පවතින අවස්ථාවක් බැවින් සංවර්ධන යෝජනා කිසිවක් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇති බවද එබැවින් ගරු සභාපතිතුමාට ගරු සභිකවරයෙකු වෙත මන්ත්‍රී ප්‍රතිපාදන වෙන් කිරීමට නොහැකි බවද පවසන ලදී. එමෙන්ම ගරු ආණ්ඩුකාරතුමා විසින් ගරු සභාපතිතුමා සභාපති ධූරයෙන් නෙරපා හැරීමට ගැසට් නියෝගයක් නිකුත් කර ඇති අවස්ථාවක ගරු සභාපතිතුමා රිට් ආඥාවක් මඟින් සේවයේ පිහිටුවා ඇති බවද එසේම නඩුවක් පවතින අතරතුර සභාපති ධූරයේ සිටින බැවින් ගරු සභාපතිතුමාට පූර්ව අනුමැතියකින් තොරව කිසිඳු දෙයක් ඉටු කිරීමට නොහැකි බවද අවශ්‍යනම් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව මුදල් වියදම් කිරීමට හැකියාවක් ලැබෙන බවද පවසන ලදී.

එබැවින් මේවන විට කොවිඩ් 19 වසංගතයෙන් ලංකාව මෙන්ම බලංගොඩ නගරයද වෙලාගනිමින් පවතින අවස්ථාවක් බැවින් සභාවේ අරමුදල් යොදා බළන්ගොඩ නගරයේ ජනතාවට කොවිඩ් ප්‍රතිශක්තීකරණ එන්නත ලබා දෙන ලෙසද ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන බවද එනමුත් සංවර්ධන යෝජනාවලට අනුමැතිය ලබා නොදෙන බවද පවසන ලදී. තම පක්ෂයද නඩුවක් තබාගෙන බලා සිටින්නේ දවසකට හෝ සභාවේ බලය ලබා ගැනීමට බවද තමන්ට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන තම රජය මඟින් ලැබෙමින් පවතින අතර ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමාට වැරදීමකින් හෝ මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කළේ නම් එය ඉල්ලා අස්කර ගන්නා ලෙසද අවශ්‍යනම් බෙදීමකට වුවද යා හැකි බවද පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ දිනකට හෝ සභාව ගත යුතු බව හා මෙය දේශපාලන ප්‍රශ්නයක් මත සිදුවන දෙයක් බව ගරු මන්ත්‍රීතුමා පැවසූ අතර එවැනි දෙයක් සභාවේදී පැවසීම පිළිබඳ ස්තුතිවන්ත වන බවද අයවැය සම්බන්ධව දීර්ඝව සාකච්ඡා කිරීම අවශ්‍ය නොවන අතර අයවැය සම්බන්ධව ප්‍රශ්නයක් ඇති කළේ සභාවේ මන්ත්‍රීතුමන්ලාම බවද පවසන ලදී. තමන් පමණක් රිට් ආඥාව ගෙන සභාපති ධූරයේ සිටිනවා නොව මෙවැනි අසාධාරණකම් සිදු වූ වෙනත් සභාපතිතුමන්ලාද රිට් ආඥාවක් මඟින් සභාපති ධූරයේ සිටින බවද ගරු විපක්ෂයේ අයවැය ගැටලුවක් නිසා හෝ ගරු සභාපතිතුමාගේ වැරැද්දක් නිසා හෝ නොව අයවැය පරාජය කරන්නේ දේශපාලනික තීරණයක් නිසා බව එදත් පැවසූ අතර අදත් පැවසූ බවද එසේ පැවසීම පිළිබඳ ස්තුතිවන්ත වන බවද ගරු මන්ත්‍රීවරුන් අයවැය පරාජය වී ඇති බවට පැවසුවද මේ වන විට ඒ පිළිබඳව නීතිපති මතය පැමිණ නොමැති බවද මෙවැනි

ලෙසම අයවැය පරාජය කළ සභාවන්හි ඒ පිළිබඳව නීතිපති මතය පැමිණ ඇති අතර එහිදී අයවැය සම්මත බවට නීතිපති මතය පැමිණ ඇති බව ද පවසන ලදී.

වැඩිදුරටත් අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ කුමන ප්‍රශ්නයක් මත හෝ ගරු මන්ත්‍රීවරුන් සිරකරගෙන සිටින්නේ බළන්ගොඩ ජනතාවගේ අයිතිවාසිකම් බවද ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමාට වැරදීමක් සිදුව නොමැති බවට තමන් සිතන අතර එසේ වැරදීමක් සිදුව ඇතිනම් ගරු සභාවේදී පවසන ලෙසද සෑම සභිකයෙකුටම අවශ්‍යව ඇත්තේ තමන්ව පත්කරන ලද ප්‍රදේශයේ ජනතාවට සේවය කිරීම බවද සභාවේ අනුමැතිය ලබා දෙන්නේනම් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමේ හැකියවක් පවතින බවද ගරු සභිකවරුන් ඒ සඳහා විරුද්ධවන්නේ ද්වේෂ සහගතව බළන්ගොඩ ප්‍රදේශයේ ප්‍රජාවට විරුද්ධ වීමක් බවද සභාව අකර්මන්‍ය කිරීමේ අරමුණ වන්නේ එක් දිනක් හෝ සභාව ලබා ගැනීමේ අරමුණින් බව එතුමා පැවසීම පිළිබඳ සතුටු වන අතර එය තමන්ගේ ඉදිරි කටයුතු සඳහා ප්‍රයෝජනවත් වන අතර බළන්ගොඩ බදු ගෙවන ජනතාවට තමන් ගෙවන බදු මුදලට සාධාණයක් ඉටු කිරීමට නොහැකි වීම පිළිබඳ කණගාටු වන බවද පවසන ලදී. එබැවින් මේ සඳහා බෙදීමක් අපෙක්ෂය බවටෙ ගරු සභාපතිතුමන් විසින් සිදු කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දක්වමින් ගරු සභාපතිතුමා බොහෝම සූක්ෂම ලෙස කටයුතු කරන බවද ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා සිටින ස්ථාවරයේ පක්ෂයේ සියලු දෙනා සිටින බවද ගරු සභාපතිතුමා සමග තිබෙන පෞද්ගලික ප්‍රශ්නයක් නොව අවුරුදු දෙකක් ගිය තැන අයවැයට පරාජය වීමට අයිතියක් තිබෙන බවද 2021 අයවැය සම්මත කිරීමේදී පැවති පළමු සභාවේදී අයවැය සම්මත නොමැති බව පළාත් සභාවෙන් පැවසූ පසු අනතුරුව දෙවන අවස්ථාවේදී අයවැය සම්මත කිරීමට පැවති සභාවේදී ඡන්ද විමසීමක් කළ අතර එහිදී ගරු සභාපතිතුමා ඇතුලු සභාපතිතුමාගේ පක්ෂයේ මන්ත්‍රීවරුන් ඡන්දය ලබා දීමෙන් වැළකී සිටි අතර එය ගැටලු සහගත බවද එම අයවැයද නිවැරදි ආකාරයට සභාවේ සම්මත වී නොමැති බවද අයවැය සම්මත නොවී තිබෙන බැවින් පුනරාවර්තන වියදම් පමණක් දැරීමට පමණක් හැකි බව පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා විසින් ලිපියක් මඟින් දැනුම්දී ඇති බවද එබැවින් මෙම සංවර්ධන යෝජනා වලට අනුමැතිය ලබා දීමේ ගැටලුවක් පවතින බවද ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා යෝජනා කළ පරිදි මන්ත්‍රීවරුන් 17 දෙනා සඳහා ලක්ෂ 15 බැගින් ලබා දෙන මුදල කොවිඩ් 19 ප්‍රතිශක්තිකරණ එන්නත ලබා දීම සඳහා ලබා දෙන ලෙසද තමන් විසින් එම යෝජනාව සිදු කළ බවද නදීශාන් මැතිතුමා විසින් සිදු කළ යෝජනාවේ පවතිනුයේ කොට්ඨාශයේ අත්‍යවශ්‍ය සංවර්ධන කටයුතු සඳහා ලකෂ 15 ක මුදලක් වෙන් කරන ලෙස වන අතර අත්‍යවශය මාර්ග කාපට් ව්‍යාපෘතියය මඟින් සිදු කරන බවද පවසන ලදී. ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා එම යෝජනාව ඉදිරිපත් කිරීමේ ගැටලුවක් නොමැති බවද එතුමා තමාගෙන්ද විමසා එම යෝජනාව ඉදිරිපත් කළ නමුත් මෙම අවස්ථාවේදී සංවර්ධන යෝජනා ඉටු කිරීමේ හැකියාවක් නොමැති බව පවසන ලදී.

එහිදී ගරු සභාපතිතුමන් විසින් අදහස් ඉදිරිපත් කරමින් ඉටු කරන ලද කාපට් ව්‍යාපෘතියන්හි විශාල අඩුපාඩු පවතින බවද කාණු නොමැති වීම තුළ නිවාස තුළට ජලය ගලා යාම වැසිකිළි උතුරායාම් ආදිය දක්නට ලැබෙන බවද පවසන ලදී. එමෙන්ම මෙවැනිම ප්‍රශ්නයක් පාර්ලිමේන්තුවේදී පැන නැගුනු අවස්ථාවේදි ඒ සඳහා ක්‍රීඩා අමාත්‍ය නාමල් රාජපක්ෂ මැතිතුමා ඒ සඳහා කාලෝචිත පිළිතුරක් ලබා දුන් බවද පීම් එක

සඳහා අයවැය මගින් මිලියන 625 වෙන් කර තිබෙන නමුත් මෙම කොවිඩ් ගැටලුව පවතින අවස්ථාවේදී එම මුදල ඒ සඳහා වෙන් කරන්නේ කෙසේද යන්න විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් විමසා සිටි අවස්ථවේදී ඒ සඳහා පිළිතුරු ලබා දෙමින් සෞඛ්‍ය සඳහා වෙනම මුදල් අයවැය මගින් වෙන්කර ඇති අතර මෙම මුදල වෙන් කර තිබෙන්නේ පීම් සඳහා බැවින් එම මුදල වියදම් කිරීමේ ගැටලුවක් නොමැති බව පවසා සිටි බවද එමෙන්ම මෙම සංවර්ධන යෝජනා ඉටු කිරීමේ ගැටලුවක් නොමැති අතර මෙම යෝජනා වලට අවශ්‍ය අනුමැතිය ගැනීම සුදුසු බවද එය සභාවේ මන්ත්‍රීවරුන්ගේ එකමුතුකම හා යුතුකම බවද පවසන ලදී. ගරු සභාවේ මන්ත්‍රීවරුන් මෙලෙස හැසිරීමෙන් වලකින ලෙසද මේ සඳහා එක් අවස්ථාවක් ලබා දෙන ලෙසද තමන් සියලු මන්ත්‍රීවරුන් වෙනුවෙන් කථා කරන අතර සභාවෙන් පිටතට ගොස් දේශපාලනය කරන ලෙසද සභාව කඩාකප්පල් නොකරන ලෙසද පවසන ලදී. මෙය තමන්ගේ පරාජයක් නොවන අතර ජනතාවගේ පරාජයක් බවද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රීනී පී.චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් ගරු සභාපතිතුමා විසින් කාපට් ව්‍යාපෘතිය ඉටු කිරීම නිසා නිවාසවලට ජලය ගලා යෑම් වැසිකිළි උතුරා යෑම් ආදිය සිදු වන බවට පැවසුවද එවැනි කිසිඳු දෙයක් සිදු වී නොමැති බවද එසේ සිදුවුවහොත් මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ එක් වී එවැනි අවස්ථා සොයා බලා කාණු පද්ධතිය සකස් කරන බවද මෙවැනි ප්‍රකාශ සිදු කිරීම පිළිබඳ කණගාටුවන බවද රටේ මෙවැනි වසංගතයක් පවතින අවස්ථාවක මාර්ග කාපට් කිරීම ගමකට මොනතරම් හයියක්ද්‍යි විමසන ලදී. ගමේ පාර කාපට් කිරීමෙන් අවඩැක් වන බව පැවසීම කාණුගාටු බවද මොන පක්ෂය මගින් කළද මෙය අගය කිරීමක් කළ යුතු බවද පවසන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රීනී පී.චන්ද්‍රලතා මැතිතුමියගේ මානසිකත්වය පිළිබඳ කණගාටුවන බවද අද දින සම්මත වූ පසුගිය මහ සභා වාර්තාවේ තමන් කාපට් ව්‍යාපෘතිය පිළිබඳ පවසා ඇත්තේ කුමක්ද්‍යි පරීක්ෂා කර බලන ලෙසද තම හිත්වල ඇති දේ නොපවසන ලෙසද තමන් විසින් නොකියූ දේ ආරෝපණය කර වැරදි මතයක් ගොඩ නඟා කටයුතු කිරීම පිළිබඳ කණගාටුවන බව පවසන ලදී. තමන් කිසි දිනක කාපට් ව්‍යාපෘතිය අසාර්ථකයි එම ක්‍රියාව හොඳනැතැයි පවසා නොමැති බවද අකිල එල්ලාවල මැතිතුමා පාර්ලිමේන්තුවට ගිය බැවින් මෙම වරප්‍රසාද වැඩිපුර ලැබූ බව පැවසූ අතර දේශපාලනික වශයෙන් මෙතරම් කුහක නොවන ලෙස පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් කාපට් ව්‍යාපෘතිය පිළිබඳව සාකච්ඡා කිරීමේදී බළන්ගොඩ නගරය තුළ වැඩ ආරම්භ කළ එකඳු කාපට් ව්‍යාපෘතියක හෝ වැඩ අවසන් නොමැති අතර 50% ක් පමණක් වැඩ අවසන් බවද වැඩ අවසන් වීමට පෙර වැසි කාලය පැමිණි බැවින් විවිධ ගැටලු පැණ නගින බැවින් ජනතාව ද එවැනි දේ දරා ගැනීමට හැකි විය යුතු බවද කාපට් ව්‍යාපෘතිය අවසන් වීමට පෙර ඒ පිළිබඳව චෝදනා කිරීම පිළිබඳ තරයේ හෙලා දකින බවද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය අදහස් දක්වමින් කාපට් ව්‍යාපෘතිය පිළිබඳ සිදු කළ සාකච්ඡාව අනුව පැහැදිලි වන්නේ මාර්ගයක් කාපට් කළ පසු ගමේම ඇති ප්‍රශ්න අවසන් වී ඇති සේ කථා කරන බවයි. නමුත් ප්‍රධාන මාර්ගයක් කාපට් කළ පමණින් ගමේ සංවර්ධනය අවසන් නොවන අතර ගමේ ඇති අතුරු මාර්ග සංවර්ධනය කිරීමට තිබෙන බවද එවැනි යෝජනා ඉටු කිරීම සඳහා ලක්ෂ 15 යෝජනා ඉදිරිපත් කර ඇති බවයි. ගරු මන්ත්‍රීවරුන් සභාව වෙත පැමිණෙන්නේ දීමනාව රැගෙන යාමට පමණක්

නොවන අතර මෙම සභාව වෙත බලය ඇත්තේ තවත් මාස ගණනාවකට පමණක් බැවින් ගමට යමක් ඉටු කළ යුතු බවද සභාවේ නිකරුණේ විවාද කිරීම තේරුමක් නොමැති බැවින් බෙදීමකට යාම සුදුසු බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා අදහස් දක්වමින් මෙම රජය විසින් සිදු කරනු ලබන කාපට් ව්‍යාපෘතිය හොඳ ලස්සන වැඩක් බවද කුමන ආණ්ඩුව විසින් සිදු කළද හොඳ දේ අනුමත කරන බවද ගරු සභාපතිතුමන් විසින් ලක්ෂ 15 යෝජනා ලබා දෙන ලෙස පැවසුයේ විශාල සංවර්ධන ව්‍යාපෘති ඉටු කිරීමට නොව කොට්ඨාශයේ ඇති කුඩා සංවර්ධන යෝජනා ඉටු කිරීමට බවද එවැනි දේ සඳහා වෙනත් කොහෙන් හෝ මුදල් නොලැබෙන බවද මෙම මුදල ලබා දෙන ලෙස පවසන ලදී. දීමනාව පමණක් ගෙන යාම ප්‍රමාණවත් නොවන අතර මෙම යෝජනා ඉටු කිරීම සඳහා සභා අරමුදල් ලබා දෙන ලෙස පවසන ලදී. පුද්ගලික වාසි ගෙන දේශපාලනය ඉටු කිරීම සුදුසු නොවන අතර කිසිදු කෙනෙක් මෙය දේශපාලනයට හරවා ගැනීම සුදුසු නොවන අතර සියලු දෙනා එක්ව මෙම ව්‍යාපෘති ඉටු කිරීම සුදුස බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් තමන් විසින් කර්මාන්ත කමිටුවේදී සිදු කළ **කොට්ඨාශයේ අත්‍යවශ්‍ය සංවර්ධන කටයුතු සඳහා එක් මන්ත්‍රීවරයෙකුට රු.1,500,000.00ක් ලබාදීම** යන යෝජනා තමන් ඉල්ලා අස් කර ගන්නා බව පවසන ලදී.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා විසින් එක් මන්ත්‍රීවරයෙකු සඳහා සංවර්ධන යෝජනා ඉටු කිරීමට රුපියල් ලක්ෂ 15 ක මුදලක් වෙන් කිරීම සුදුසු බවට කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමා විසින් බළන්ගොඩ නගර සභාවේ වර්ෂයේ අයවැය පරාජය වී ඇති බැවින් ගරු සභාපතිතුමාට සංවර්ධන යෝජනා සඳහා මුදල් වෙන් කිරීමට නොහැකි බැවින් එම යෝජනාව ප්‍රතික්ෂේප කරන බවට ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් සිදු කළ යෝජනාව එතුමා විසින් ඉල්ලා අස්කර ගත් බැවින්ද මෙම අවස්ථාවේදී ඉදිරිපත් කළ යෝජනා න්‍යාය පත්‍රයේ නොමැති නිසාද මෙම කිසිඳු යෝජනාවක් සළකා බැලීමට අවස්ථාව නොලැබෙන බැවින් එම සියලු යෝජනා ප්‍රතික්ෂේප කරන බව පවසන ලදී. එබැවින් අද දින න්‍යාය පත්‍රයේ ගරු සභාපතිතුමාගේ යෝජනා අංක 05ඃ01ඃ33 සිට 05ඃ01ඃ37 දක්වා වූ යෝජනාද ගරු මන්ත්‍රීවරුන්ගේ 06ඃ02ඃ01 සිට යෝජනා අංක 06ඃ08ඃ09 දක්වා වූ සියලු සංවර්ධන යෝජනා ද ප්‍රතික්ෂේප වන බව පවසන ලදී.

**05ඃ01ඃ35** පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීමේදී සාධාරණව කටයුතු කරන ලෙස අදාළ ටෙන්ඩර්කරු විසින් ඉල්ලීමක් සිදුකර ඇත. මේ පිළිබඳව සභා තීරණයක් ලබා ගැනීම.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ රටේ පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ බස් රථ ධාවනය 60% කින් පමණ අඩු වී ඇති බවට අදාළ ටෙන්ඩර්කරු විසින්

පවසා ඇති අතර ඒ බව සනාථ කර ස්ථාන භාර නිළධාරිතුමා විසින්ද ලිපියක් ඉදිරිපත් කර ඇති බව පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් මේ සඳහා සාධාරණයක් ඉටු කිරීම සුදුසු බව පවසන ලදී.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් යෝජනාවක් ඉදිරිපත් කරමින් 2021 මැයි හා ජූනි මස දෙක තුළදී අදාළ ටෙන්ඩර් මුදලින් 50% ක ගාස්තුවක් අය කිරීම සුදුසු බවට කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06. මන්ත්‍රී යෝජනා**

**06ඃ01 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

06ඃ01ඃ01 නගරයේ පොළ භූමිය තම වාසස්ථානය කරගෙන සිටින යාචක පවුල්වල දරුවන්ගේ ප්‍රශ්න නිරාකරණය කර දීම සඳහා කමිටුවක් පත්කර ඔවුන්ගේ ගැටලුවලට විසඳුමක් ලබා දීම.

ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් මෙය ඉතා සංවේදී කාරණයක් බවද මොවුන් නගර සභාවේ කසළ ටෙන්ඩරය ක්‍රියාත්මක කරන පුද්ගලයා වෙත සේවය ලබා දෙන පුද්ගලයන් බවද මොවුන්ගේ දරුවන් 06 දෙනෙකු සිටින අතර එක් දරුවෙකුට උප්පැන්න සහතිකයක් හෝ නොමැති බවද මෙය පළාත් පාලන විෂය පථයට අයිති දෙයක් නොවූවද ප්‍රාදේශීය ලේකම් සමඟ සාකච්ඡා කර විසඳුමක් ලබා දීම සුදුසු බව පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමන් විසින් එහි නගර සභාවේ නියෝජිතයා ලෙස ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පත්කරන බව පවසන ලදී. එමෙන්ම අදාළ ආයතන සියල්ල එක් කර කමිටුවක් සාදා අවශ්‍ය නිර්දේශ ලබා ගන්නා ලෙසත් එවිට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත හැකි බවත් පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා ප.ව.1.45ට පමණ ගරු සභාවෙන් පිටව යන ලදී.**

**06ඃ02 ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා**

06ඃ02ඃ01 බළන්ගොඩ දෙහිගස්තලාව කොට්ඨාශයේ ආදිල් මහතාගේ මෝටර් සයිකල් වැඩපල අසලින් නිවෙස්වලට යන අතුරු මාර්ගය නගර සභාවට පැවරීම. (ඔප්පු සහ ග්‍රාම නිළධාරිනියගේ ලියුම් ලබා ගෙන ඇත.)

ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා ප.ව.1.50ට පමණ ගරු සභාවෙන් පිටව යන ලදී.**

**07. කර්මාන්ත කමිටුව මඟින් නිර්දේශ කරන ලද යෝජනා**

**07:01.ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා**

07:01:01 කුමාරගම සුගතදාස මහතාගේ සහ තවත් අයගේ නිවෙස් සඳහා යන මාර්ගය නඩත්තු කර සංවර්ධනය කිරීම.

07:01:02 ඇල්ලෙපොල සරස්වතීවත්ත මාලිගාතැන්න මාර්ගය නඩත්තු කර සංවර්ධනය කිරීම.

ඉහත සඳහන් යෝජනා ගරු සභාපතිතුමන් විසින් සභායට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:02 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමආරච්චි මැතිතුමා**

07:02:01 කොට්ඨාශයේ අත්‍යවශ්‍ය සංවර්ධන කටයුතු සඳහා එක් මන්ත්‍රීවරයෙකුට රු.1,500,000.00ක් ලබාදීම.

07:02:02 වැවවත්ත කෝවිල පිටුපස වැසිජල කාණුව අවහිර වී විශාල පාරිසරික ගැටළුවක් නිර්මාණය වී ඇත. එම කාණුව පිළිසකර කිරීම සඳහා පහත සඳහන් අමුද්‍රව්‍ය ලබාදීම. (පිළිසකර කිරීමේ කටයුතු ප්‍රදේශවාසීන්ගේ ශ්‍රම දායකත්වයෙන්)

අඩි 1 1/2 හියුම් පයිප්ප -02
ගල්
වැලි
සිමෙන්ති

07:02:03 ර/විද්‍යාලෝක මධ්‍ය මහා විද්‍යාලයේ චෛත්‍යය ඉදිකිරීමට සැලසුම් කර ඇති භූමිය සකසා ගැනීම සඳහා ජේ.සී.බී.යන්ත්‍රය සහ ටිපර් රථය ලබාදීම.

07:02:04 බළන්ගොඩ සම්බන්ධීකරණ කමිටුවේ ගරු සභාපතිතුමාගේ මූලිකත්වයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ප්‍රමුඛව බළනගොඩ අනෙකුත් රාජ්‍ය ආයතන එක්ව සංවිධානය කරන වෙසක් කලාපයට සමගාමීව නගරය විදුලි පහන්වලින් ආලෝකමත් කිරීම සඳහා දළ වශයෙන් වැයවන (රුපියල් ලක්ෂ 03 ක) මුදල ලබාදීම.

07:02:05 බුලත්ගම ඇස්සැද්දුම එපිටපැත්ත මාර්ගයේ සහ දෙණියකුඹුර මාර්ගයේ යෝජිත පානීය ජල ව්‍යාපෘතියේ ජලනල එළීම සඳහා කාණු කැපීමට ජේ.සී.බී.යන්ත්‍රය ලබාදීම.

ඉහත සඳහන් යෝජනා ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් සිථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ තමන් ඉදිරිපත් කළ 07ඃ02ඃ01 යෝජනාව ඉල්ලා අස්කර ගත් අතර 07ඃ02ඃ04 යෝජනාව ක්‍රියාත්මක නොවන බවද තමන් විසින් ඉදිරිපත් කළ ඉතිරි යෝජනා කඩිනමින් ක්‍රියාත්මක කරන ලෙසයි.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07ඃ03 ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**

07ඃ03ඃ01 බෝම්බුව - වතුකාරගොඩ මාර්ගය අබලන්ව ඇති බැවින් එය පිළිසකර කිරීම.

07ඃ03ඃ02 වතුකාරගොඩ - උඩකන්ද මාර්ගයේ අබලන්ව ඇති කොටස් කොන්ක්‍රීට් යොදා නැවත සකස් කිරීම..

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් තමන් විසින් ඉදිරිපත් කළ යෝජනා කඩිනමින් ඉටු කරන ලෙස පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07ඃ04 ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය**

07ඃ04ඃ01 හුණුකුඹුර ගාලවත්ත මාර්ගය තාරදමා නඩත්තු කිරීම.

ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් සභාවට ඉදිරිපත්කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07ඃ05 ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

07ඃ05ඃ01 කිරි මණ්ඩලය අසල ජලය බැස්සවීමේ ප්‍රශ්නයට විසඳුමක් ලබාදීම.

07ඃ05ඃ02 කරච්කැටිය 05 වන පටුමගේ චින්තක මහතාගේ නිවස ඉදිරිපිට තනා ඇති කාණුව ක්‍රමවත් කිරීම.

07ඃ05ඃ03 කරච්කැටිය- උඩකන්ද හංදියේ වෛද්‍යතුමාගේ නිවස ඉදිරිපිට ක්‍රමානුකූලව ජලය බැස්සවීම.

07ඃ05ඃ04 කරච්කැටිය - කහවන්දල මහතාගේ නිවසට පිවිසුම් මාර්ගය කොටසක් කපා මාර්ගය කාපට් කිරීමට

අවස්ථාව ලබාදුන් අතර, නිවසට පිවිසුම වාහනයක් ගැනීමට හැකි ආකාරයට තනාදීම.

07෴05෴05 ගඟ දිගේ ඇති පොළ මාර්ගයේ ඉතිරි කොටස වලවල් වසා නඩත්තු කරදීම.

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී පී.චන්ද්‍රලතා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් 07෴05෴01 යෝජනාව පිළිබඳ විශාල ගැටලුවක් පවතින බැවින් එය කඩිනමින් විසඳන ලෙස ද තමන් විසින් ඉදිරිපත් කළ ඉතිරි යෝජනා සියල්ල කඩිනමින් ඉටු කරන ලෙසද පවසන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් 07෴05෴01 යෝජනාව සංවර්ධන යෝජනාවක් බැවින් එය ඉටු කිරීමට නොහැකි බව පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා ප.ව.1.55ට පමණ ගරු සභාවෙන් පිටව යන ලදී.**

**07෴06 ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය**

07෴06෴01 කොටුගොඩැල්ල ඉන්ද්‍රානි මහත්මියගේ නිවස ඉදිරියෙන් ඇති කාණුව පිළිසකර කරදීම.

07෴06෴02 ඉදිරියේදී ලබාදෙන බවට පැවසූ ලක්ෂ 05 ක මුදල වැඩිකොට ගරු ආණ්ඩුකාරතුමාගේ අවසරයක් රැගෙන ලබාදීමට කටයුතු කිරීම.

07෴06෴03 කරව්කැටිය ගල්වල පාර අබලන් පාලමේ වැට ඉදිකරදීම.

07෴06෴04 උඩකන්ද පාර කොන්ක්‍රීට් ඇතිරීමට අදාළව රඳවාගත් මුදල ලබාදෙන ලෙස කළ ඉල්ලීම.

07෴06෴05 ගරු සුනේත්‍රා වීරසිංහ මන්ත්‍රීතුමිය සහ තවත් නිවාස 03 කට යන මාර්ගය (මීටර්150) දුර ඉතාම අබලන් බැවින් එය නඩත්තු කිරීම.

07෴06෴06 කැළණි ඒජන්සිය ඉදිරිපිට වැසි ජලය ගලා බසින කාණුව වැසී ඇති බැවින් එය සකස් කිරීම.

ඉහත සඳහන් යෝජනා ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් තමන් විසින් ඉදිරිපත් කළ ඉහත යෝජනා ක්‍රියත්මක කරන ලෙසද 07෴06෴04 යොජනාව පරිදි එම මාර්ගයේ කිසිඳු ගැටලුවක් දැන් නොමැති බවද 07෴06෴05 යෝජනා ඉටු කිරීම සඳහා ඉවත් කරන ලද ඉන්ටර්ලොගින් ගල් හෝ ලබා දෙන ලෙසද පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07ඃ07 ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා**

07ඃ07ඃ01 රයිවත්ත ඒ.ඒ.උපුල් චමින්ද මහතා සහ එම ගමෙහි ජීවත්වන පවුල්වලට මාර්ගය පිළිසකර කර ගැනීමට රජයෙන් අනුමැතිය ලබාදී ඇති අතර, මෙම පටු මාර්ගය පළල් කර ගැනීම සඳහා නගර සභාවේ ජේ.සි.බී.යන්ත්‍රය ලබාදීම.

07ඃ07ඃ02 ඕළුගංතොට හංදිය අසලින් රයිවත්ත මාර්ගයේ විශාල වලක් සැකසී ඇති බැවින් එය තාර යොදා පිළිසකර කර දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් 07ඃ07ඃ01 යෝජනාව පිළිබඳව සාකච්ඡා කිරීමේදී එම මාර්ගය සකස් කිරීම සඳහා රජයෙන් අනුමැතිය ලබා දී ඇති එම අවස්ථාව සඳහා සහභාගි වූ මන්ත්‍රී මණ්ඩලය සඳහා ස්තුතිවන්ත වන අතර සභාවේ ජේ.සි.බී.යන්ත්‍රය ලබාදීම පිළිබඳව ගරු සභාපතිතුමා වෙත ස්තුතිය පළ කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07ඃ08 ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මලික්ෂා මැතිතුමා**

07ඃ08ඃ01 බළන්ගොඩ ෆලීල් හජ්ජියාර් මාවත සම්පූර්ණයෙන්ම අබලන් වී ඇති හෙයින් එම මාර්ගය කඩිනමින් අළුත්වැඩියා කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මේ වන විට මෙම මාර්ගය සකස් කර අවසන් බැවින් ඒ සඳහා සභාපතිතුමා ඇතුලු සභාව සඳහා ස්තුතිය පළ කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

**09. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

2021-04-01 දින සිට 2021-04-30 දක්වා [illegible] වාර්තාව

| | |
|---|---:|
| පුනරාවර්තන ලැබීම් | **8,419,710.67** |
| වෙනත් ලැබීම් | **3,789,611.51** |
| මුලු ලැබීම් | **12,209,322.18** |
| පුනරාවර්තන වියදම් | **10,059,703.99** |
| වෙනත් වියදම් | **3,541,656.85** |
| මුලු වියදම් | **13,601,360.84** |

2021-04-01 දින සිට 2021-04-30 දක්වා ඉන්ධන වාර්තාව

| වාහන අංකය | මුළු එකතුව |
|---|---|
| 56-1906 | 17,703.92 |
| 227-5020 | 28,992.50 |
| RD - 8240 | 30,368.00 |
| BC-0005 | 20,800.00 |
| QL2901 | 2,192.00 |
| 226-7521 | 6,344.00 |
| LL - 7688 | 6,240.00 |
| RB4786 | 9,823.84 |
| RE 2600 | 17,992.00 |
| JD 4684 | 1,644.00 |
| GC0001 | 4,658.00 |
| GK-6227 | 19,136.00 |
| CSM0009 | 1,064.00 |
| RC1107 | 26,380.95 |
| RC8183 | 5,096.00 |
| ND5124 | 19,819.28 |
| PF-4006 | 35,244.00 |
| SDRR0013 | 548.00 |
| RD 8000 | 10,608.00 |
| 37-7933 | 6,552.00 |
| LL-2110 | 7,077.00 |
| RC 1118 | 5,200.00 |
| UQ - 1933 | 2,740.00 |
| VI1833 | 3,425.00 |
| ZA9835 | 20,140.95 |
| ZA 5039 | 56,316.00 |
| DDR 0008 | 1,985.85 |
| එකතුව | **368,091.29** |

**මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**10. ඇස්තමේන්තු අනුමත කිරීම**

**10ඃ01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා**

10ඃ01ඃ01 කරව්කැටිය මාර්ගයේ උඩකන්ද හන්දියේ අත්‍යවශ්‍ය කාණු කොටස ඉදි කිරීම. - රු.79,000.00

10ඃ01ඃ02 කිරි මණ්ඩලය පිටුපස අත්‍යවශ්‍ය හියුම්පයිප්ප කාණු පද්ධතිය ඉදි කිරීම.- රු.917984.33

10ඃ01ඃ03 බළන්ගොඩ නගර සභාවේ ප්‍රධාන දොරටුව අසළ ඉදි කිරීමට නියමිත හිඳි බුද්ධ ප්‍රතිමාව සහිත බුද්ධ මන්දිරය ඉදි කිරීම - රු.805,960.00

ඉහත සඳහන් ඇස්තමේන්තු ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ සංවර්ධන යෝජනා සඳහා සභාවේ අනුමැතිය හිමි නොවූ බැවින් ඉහත සඳහන් කර්මාන්තයන්හි ඇස්තමේන්තු අනුමත කිරීමට නොහැකි බව පවසන ලදී.

**11. පෞද්ගලික මන්ත්‍රි පැහැදිලි කිරීම්**

**ගරු නාගරික මන්ත්‍රීනී එම්.පී.ශාන්තිලේඛා මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රීනී එම්.පී.ශාන්තිලේඛා මැතිතුමිය අදහස් දක්වමින් සරස්වතීවත්ත සුසාන භූමියට මාර්ගය නඩත්තු කළ යුතු තත්ත්වයේ පවතින අතර ඒ සඳහා ඉවත් කරන ලද ඉන්ටර්ලොගින් ගල් හෝ අතුරා මාර්ගය සකස් කරන ලෙසද එම සුසාන ගෙය ඉදිකර විශාල කාලයක් ගතව ඇති බැවින් එය ඒ ආශ්‍රිත මරණාධාර සමිතියකට භාර දී මහජනතාව වෙත ලබා දීම සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කරන ලෙසද පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා විසින් මෙම නඩත්තු යෝජනාව ලබන මස කර්මාන්ත කමිටුව වෙත ඉදිරිපත් කරන ලෙස පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රීනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රීනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය අදහස් දක්වමින් නවක මන්ත්‍රීවරික් ලෙස අද දින සභාවට පත්ව ආ තමා මෙම සුභ අවස්ථාවේදී ප්‍රථමයෙන්ම මහජන එක්සත් පෙරමුණේ නායක ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා හා පාර්ලිමේන්තු මන්ත්‍රී යදාමිණි ගුණවර්ධන මැතිතුමා ඇතුලු පක්ෂයේ සියලුම ලේකම්වරුන් ද රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා ඉතා ආදරයෙන් ගෞරවයෙන් සිහිපත් කරන ලදී. 2018 වර්ෂයේ පැවති පලාත් පාලන මැතිවරණයේදී ශ්‍රී ලංකා පොදු ජන එක්සත් පෙරමුණ සමඟ සටන් වැදුන අවස්ථාවේදී ගරු අකිල එල්ලාවල මැතිතුමාගේ නායකත්වයෙන්

බළන්ගොඩ ආසනයේ වැඩිම ආසන සංඛ්‍යාවක් දිනා ගැනීමට තම කණ්ඩායම සමත් වූ අතර එම අවස්ථාවේදී හුණුකුඹුර කොට්ඨාශයෙන් මහජන එක්සත් පරමුණේ කාන්තා නියෝජනය ලෙස තමන් ඉදිරිපත් වූ බවද මන්ත්‍රීවරියක වශයෙන් ගම නගරය දියුණු කිරීමට අවස්ථාවක් හිමි වීම පිළිබඳ සතුටට පත් වන බවද ගම නගරය දියුණු කිරීමට තම උපරිම කැපවීම හා දායකත්වය ලබා දෙන බව පොරොන්දු වන බව පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා**

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා විසින් ප්‍රථමයෙන්ම නවක මන්ත්‍රීතුමිය වෙත සුභ පැතුම් එක් කරන ලදී. ඉතාම අබලන් තත්ත්වයේ පැවති ෆලීල් හාජ්ජියාර් මාවත සංවර්ධනය කිරීම පිළිබඳ ගරු සභාපතිතුමා ඇතුලු සභාවට ස්තුතිය පිරිනමන ලදී. එමෙන්ම සභාවේ ප්‍රතිපාදන පවතින බැවින් එම මුදල් ප්‍රතිපාදන මඟින් ජනතාවට සේවයක් ඉටු කිරීමට හැකියාවක් තිබියදී අද දින සභාවේ සංවර්ධන යෝජනා අනුමත නොවූ බැවින් එම අවස්ථාව මඟ හැරී ගිය බවද ඒ පිළිබඳව කණගාටුව පළ කරන බවද පවසන ලදී.

එමෙන්ම සුබයිර් ආලීම් මාවත වතුර බැසීම සම්බන්ධව පවතින ගැටලුව පිළිබඳ අවධානය යොමු කරන ලෙසද එම නිවෙස් හිමියගේ නිවසේ ජලය පිරෙන බැවින් ඔවුන් අසරණ තත්ත්වයට පත්ව ඇති බවද නගර සභාව විසින් සිදු කළ වැරදි නිසා අද ඔවුන් දුක් විඳින බවද එම ගැටලුව පිළිබඳ කඩිනම් විසඳුමක් ගන්නා ලෙසද කොවිඩ් 19 රෝගය සඳහා සියලු දෙනා එක්ව මුහුණ දිය දුතු බවද අක්කර 18 ප්‍රදේශයේ විශාල ගැටලුවක්ව පැවති පානීය ජල ගැටලුව සඳහා විසඳුමක් ලබා දීම පිළිබඳව ගරු සභාපතිතුමා ඇතුලු සභාව වෙවත ස්තුතිය පළ කරමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් අද දින සභාවේදී ලක්ෂ 15 සංවර්ධන යෝජනා සම්මත කර ගැනීමට නොහැකි වීම පිළිබඳව ඉතාම කණගාටුදායක වන බවද ඉදිරියේදී මැතිවරණයක් පවතින අතර ගමේ ජනතාවට කුමක් හෝ සේවයක් කිරීමට හැකි අවස්ථාව මඟ හැරී ගිය බවද මහජන නියෝජිතයින් ලෙස පැමිණ මහජනාවගේ බදු මුදලින් දීමනාවක් ලබන බැවින් මහජනතාවට වගකිව යුතු බවද සභාව මඟින් මෙම යෝජනා අනුමත කර ගරු ආණ්ඩුකාරතුමා වෙත ගියේ නම් අනුමැතිය ලබා ගැනීමට හැකිව තිබූ බවද පවසන ලදී.

එමෙන්ම පවත්නා කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් කරව්කැටිය ප්‍රදේශයටද බලපෑමක් සිදුව ඇති බැවින් සභාවේදී කොවිඩ් 19 සම්බන්ධව පවත්වන රැස්වීම් පිළිබඳව දැනුවත් කරන ලෙසද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා ප.ව.2.30ට පමණ ගරු සභාවෙන් පිටව යන ලදී.**

**ගරු නාගරික මන්ත්‍රී කේ.පී.පේමදාස මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී කේ.පී.පේමදාස මැතිතුමා අදහස් දක්වමින් කොවිඩ් 29 වසංගත තත්ත්වය පිළිබඳ සාකච්ඡා කිරීමේදී වසංගත රෝග පිළිබඳ සිටින ජ්‍යෙෂ්ඨතම මහචාර්යවරයා වන්නේ මහචාර්ය තිස්ස විතාන මහතා බවද නමුත් එතුමා තමන්ව ජාතික කොරෝනා මර්ධන කමිටුව වෙත නම් කර ගන්නා ලෙස පැවසුවද එතුමාවද එම කමිටුවට නම් කර නොගත් බවද මෙහිදී ප්‍රමුඛතාව ලබා දිය යුත්තේ වෛරස් සම්බන්ධ අවබෝධය ඇති වෛද්‍යවරුන්ට මිස පිටස්තර අයට නොවන බවද මේ සම්බන්ධව අද වන විට හමුදාපති එක් දෙයක්ද නියෝජ්‍ය පොලිස්පති එක් දෙයක්ද වසංගත රෝග පිළිබඳ විශේෂඥයින් එක් දෙයක්ද දේශපාලඥයින් තවත් දෙයක්ද පවසන නමුත් සත්‍ය දේ ජනතාව නොදන්නා බවද පවසන ලදී. ඉන්දියාවේ ජනතාව මැරෙන මට්ටමට සාපේක්ෂව ලංකාවේ ජනතාව මිය යන මට්ටමද ළඟා වී ඇති අතර ඉන්දියාවේ ජනතාව මියයන ආකාරය මාධ්‍ය තුළ වුවද පෙන්වීමට අවශ්‍ය නොවන බවද එමගින් ජනතාව විශාල බියකට පත්වන බවද ජනතාව හුස්ම ගැනීමට පවා බිය වන අතර අද වන විට පෞද්ගලික අංශයේ අය මෙය ව්‍යාපාරයක් බව පත්කර ගෙන ඇති බවද පවසන ලදී. රටේ මෙතරම් ව්‍යාකූල තත්ත්වයක් තිබියදී අලුත් අවුරුදු සමයේදී ජනතාව හරක් ගාල කැඩුවා සේ ඇවිදි බවද අද වන විට රට පුරාම වෛරසය පැතිරී ඇති බවද මේවන විට මෙය පාලනය කිරීමට නොහැකි වී ඇති අතර කොවිඩ් රෝගීන් සඳහා අයිසීයූ ඇඳන් 18 ක් පමණක් වෙන් කර ඇති බවද අශ්වයා පැනලා ගියාට පසු ඉස්තාලය වසා පලක් නොමැති බවද ලංකාවේ පොහොරවලට රජය මගින් සහනාධාර දී පොහොර ගෙනෙන සමාගම් වෙත ණය වී ඇති බැවින් එම සමාගම් විසින් මේ වන විට මෙරටට පොහොර නිකුත් නොකරන බවද මේවන විට රසායනික ද්‍රව්‍ය නොමැතිව කිසිදු බීජයක් පොහොර නොමැතිව වගා කිරීමට නොහැකි තත්ත්වයක් උදා වී ඇති බවද මෙරට තිබූ සම්ප්‍රදායික බෝග වර්ග සියල්ල විනාශ කර බහුජාතික සමාගම්වලට අවශ්‍ය පරිදිබීජ වර්ග හා යෙදවුම් ගෙනා බවද මෙය ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ බැරිකමක් පමණක් නොව අවුරුදු 71 ක් පුරා ආ ධනවාදයේ ප්‍රතිඵල බවද පවසන ලදී.

එමෙන්ම කාපට් මාර්ග සකස් කිරීම කළ යුතු වැඩක් වුවද ඇතැම් අවස්ථාවලදී හොඳ තත්ත්වයේ පවතින මාර්ගද කඩ දමා කාපට් කරනු ලබන අවස්ථා දැකිය හැකි බවද මෙරට මිනිසුන් දිනකට 4 ක් 5ක් අලි ගසා මැරෙන බවද වකුගඩු රෝගීන් දහස් ගනනක ඖෂධ නොමැතිව දුක් විඳින බවද පාසල් නොමැතිව බොහෝ දරුවන් සිටින බවද වරායවල් ඉදිකිරීම ගුවන් තොටුපලවල් ඉදිකිරීම කාපට් මාර්ග ක්‍රීඩාංගණ ආදිය ඉදිකිරීම ආදී සියලු දේ සිදු කරනුයේ විදේශ ණය ගෙන බවද පසුගිය කාලයේදී අධිකරණයේ තිබූ නඩු විශාල ප්‍රමාණයක් කොමිසමක් පත් කර තීරණ දුන් බවද මෙලෙස රට ඉදිරියට ගියහොත් මෙරට තව තවත් පහළට යන බවද ඉන්දියාව මෙරට බොහෝ දේපල ප්‍රමාණයක් ලබා ගැනීමට උත්සහ කළ නමුදු එසේ ලබා ගැනීමට නොහැකි වූ නමුත් චීනයට ඩෙල්ෆ් නයනතිව් හා ඉරනතිව් යන දූපත් විකුණූ බවද පවසන ලදී.

වැඩිදුරටත් අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රීතුමා ඉන්දියාව ජපානය ඕස්ට්‍රේලියාව ඇමරිකාව වැනි රටවල් මෙරට විශාල ව්‍යාපෘති සිදු කරන බවද ඉන්දියාවේ ඔත්තු සේවාවන් බොහෝ ප්‍රමාණයක් ලංකාවට පැමිණ ඇති බවද පසුගිය ජනාධිපතිවරණයට පෙර ජනාධිපතිවරණයේදී මහින්ද රාජපක්ෂ මැතිතුමා පරාජය කළේ ඉන්දියාව බවද මෙම කාලය ධනවාදයේ අවසානය බවද ආණ්ඩුව සමග සහයෝගීව සිටි පක්ෂවල නායකයින් අද වන විට ආණ්ඩුව සමග විරසක වී සිටින බවද කොවිඩ් 19 ප්‍රතිශක්තීකරණ එන්නත අවශ්‍ය

අවස්ථාවේදී ඇණවුම් නොකළ බැවින් මෙටර තුළ එම එන්නත්වල හිගයක් පවතින අතර පළමු එන්නත ලබා දුන් පිරිසට දෙවන එන්නතලබා දීමට අවශ්‍ය එන්නත් නොමැති බවද ඉන්දියාවේ මෙන් මහමග මිනිසුන් මියයන ආකාකරය හා නිවෙස් තුළ මිනිසුන් මිය යන ආකාරය දැකීමට ලංකාවේ ජනතාව අකමැති බවද පවසන ලදී. ගරු සභාපතිතුමාට බළන්ගොඩ නගරයේ ජනතාවට කොවිඩ් 19 මැඩලීමට අවශ්‍ය සහයෝගය ලබා දෙන බවද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් පළාත් පාලන මහජන නියෝජිතයින් වශයෙන් කුඩා පරිපාලන ඒකකයක් තුළ සිට මහජනතාවට සංවේදී පාර්ශවක් ලෙස කටයුතු කරන බවද මෙම සභාවේදී විවිධ දේශපාලන පක්ෂ වල මහජන නියෝජිතයින් සිටින අතර තම තමන් තමන්ගේ දේශපාලන පක්ෂයේ මතය ඉදිරිපත් කරන නමුත් ඒ පිළිබඳව තර්ක කර එලක් නොමැති අතර මෙම ස්ථානයේදී ඒ පිළිබඳව තීන්දුවක් ගත නොහැකි බවද පවසන ලදී. ජාතික දේශපාලනය මෙම ස්ථානයේ කථා කර එලක් නොමැති බවද ඊට වඩා සංවේදී කාරණා මෙම සභාව තුළ කථා කිරීමට පවතින බවද ප්‍රාථමික දේශපාලනයක් ලෙස බළන්ගොඩ නගරයේ ජනතාවට ඉටු කිරීමට සේවයක් පවතීනම් එය ඉටු කිරීම සුදුසු බවද මෙම ස්ථානයේදී අනවශ්‍ය අදහස් ඉදිරිපත් කර අනවශ්‍ය මත ගැටුම් ඇති කර ගැනීම අනවශ්‍ය බවද පවසන ලදී. එමෙන්ම කොවිඩ් 19 කමිටුව සභාවේ පැවැත්වූ පසු එහි ගත් තීන්දු තීරණ පිළිබඳ ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කරන ලෙසද වැඩිදුරටත් පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් අද දින සභාව වෙත පැමිණි නවක මන්ත්‍රීවරියට සුභ පැතුම් එක් කරමින් අදහස් දැක්වීම ආරම්භ කරන ලදී. තමන් සභාවේ අද වෙනතුරු සභාවේ අනෙකුත් මන්ත්‍රීවරන්ට ගරු කරන මන්ත්‍රීවරයෙක් ලෙස ඔවුන්ගේ කථාවලට සවන් දී සභාව අවසන් වන තුරු රැඳී සිටි බව පවසන ලදී. එමෙන්ම බෝම්බුවට පිවිසෙන මාර්ගය දෙපස කැලේ වැවී ඇති බැවින් ශුද්ධ කරන ලෙස ද දෙවට මාර්ගය දෙපස කැලේ ශුද්ධ කර දෙන ලෙසද නාගරික සංවර්ධන අධිකාරිය ගොඩනැගිල්ල ඉදිරිපිට ගස්වල අතු කැපූ අවස්ථාවේදී ඒ සම්බන්ධව ගත් තීරණය කුමක්දැයි විමසන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මේ පිළිබඳව පොලිසිය විසින් ඉදිරි කටයුතු සිදු කරන බවද සමථ මණ්ඩලයෙන් ද විමර්ශනයක් සිදු කරන බව පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් අද දින සභාව සඳහා අභිනවයෙන් පත්ව ආ නවක මන්ත්‍රීතුමියට සුභ පැතුම් එක් කරන ලදී. බොහෝ කලක් තිස්සේ අබලන්ව පැවති දිගු කාලයක් තිස්සේ සභාවේදී පැවසූ ආචාරිමලේ මාර්ගය සංවර්ධනය කිරීම පිළිබඳ සභාව වෙත ස්තුතිය පළ කරන ලදී.

මෙය පුංචි සභාවක් විය හැකි අතර මෙමගින් ගන්නා තීන්දු තීරණ මධ්‍යම රජය විසින් ක්‍රියාත්මක කරන බවද එබැවින් ගමේ ජනතාව ආරක්ෂා කිරීමට ඔවුන්ගේ අවශ්‍යතා ඉටු කිරීමට දිවිහිමියෙන් කැපවන බවට

පොරොන්දු වී මෙම ස්ථානයට පැමිණි බවද සහික දීමනාව පමණක් රැගෙනයාමට මෙම ස්ථානයට පැමිණීම සුදුසු නොවන අතර දහස් ගණනක් අතරින් මෙම ස්ථානයට පැමිණියේ ජනතාවට සේවය කිරීමට බවද පවසන ලදී. ජනතාවට සේවය කිරීමට ශක්තිය තිබියදීත් එසේ කිරීමට අවස්ථාව නොලැබී ඇති අතර වෙනත් පළාත් පාලන ආයතන වලට සංවර්ධන කටයුතු ඉටු කිරීම සඳහා මුල්‍ය ශක්තිය නොමැති නමුත් අප සභාවට එම ශක්තිය පවතින බවද අද දින සභාවේදී සංවර්ධන යෝජනා අනුමත නොවීම පිළිබඳ කණගටු වන බවද ඉදිරියේ සභාව මාස 7 8 ක් පමණක් තිබෙන අතර එම කාලය තුළ මහජනතාවට සේවය කිරීමට හැකියාව ලැබේවායි ප්‍රාර්ථනා කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී පී.චන්ද්‍රලතා මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී පී.චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් අද දින සභාව සඳහා සහභාගි වූ නවක මන්ත්‍රීවරිය හුණු කුඹුර කොට්ඨාශයෙන් බිහිව ඇල්ලෙපොල කොට්ඨාශයට සේවය කිරීමට ලැබීම පිළිබඳ සතුටුවන අතර ඇය වෙත සුභ පැතුම් එක් කරන ලදී.

එමෙන්ම සරස්වතී පාර මරතේනිස් මහතාගේ නිවස අසළ ඇති පොල් ගස හා දෙල් ගස ඒ අසළ සිටින ස්වර්ණා නැමති මහත්මියගේ නිවසට අධානම් ලෙස පිහිටා ඇති බවද මේ පිළිබඳව සභාව දැනුවත් කළ ඇති අතර සභාව විසින් ලිපි ඉදිරිපත් කළද මේ වන තෙක් අදාළ අය විසින් එම ගස කපා නොමැති හෙයින් මෙම ගස් කපා ඉවත් කිරීමට අදාළ අය කඩිනමින් දැනුවත් කර අවශය ක්‍රියාමාර්ග කඩිකමින් ගන්නා ලෙසද පවසන ලදී.
වැඩිදුරටත් අදහස් දක්වන ලද ගරු මන්ත්‍රීතුමිය විසින් ඉන්දියාවේ ජනතාව කොවිඩ් 19 වසංගතයෙන් මිය යන ආකාරය ජනමාධ්‍ය තුළින් නොපෙන්වන ලෙස පැවසූ නමුත් එම පෙන්වන නිසාවෙන් ලංකාවේ ජනතාව බියට පත්වන බැවින් ඔවුන් ප්‍රවේශම් වන බවද හුණු කුඹුර අවතැන් වූ පවුල සඳහා එම අවස්ථාවේදී ගරු සභාපතිතුමාගේ නිළ නිවාසය ලබා දීම පිළිබඳ ස්තුතිවන්ත වන අතර සානුකම්පිතව බලා තව ටික දිනක් යනතුරු එම නිළ නිවස ඔවුන්ට ලබා දෙන ලෙස පවසන ලදී.

**12. අවසානය**

**ගරු සභාපති චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා**

මෙම සභාව ප්‍රදේශයේ සංවර්ධන කටයුතු ඉටු කිරීමට පවතින සභාවක් වන බැවින් ප්‍රදේශයේ පවතින ගැටලු සාකච්ඡා කර සාධාරණව විසඳීම සභවේ යුතුකමක් වන නමුත් අද දින න්‍යාය පත්‍රයේ පැවති කාරණාවලින් සම්මත වූ කරුණු පිළිබඳ තීරණ ගැනීමට සභාවක් අවශ්‍ය නොවන අතර එම තීන්දු කාර්යාලීය කටයුතු දෛනිකව කරගෙන යාමට අවශ්‍ය යෝජනා බවද නිළධාරීන් එක්ව පමණක් වුවද එම කාරණා ඉටු කිරීමට අවස්ථාව තිබෙන අතර මන්ත්‍රීවරයෙකු විසින් තම කොට්ඨාශයට ඉටු කළ යුතු සංවර්ධනයන් ඉටු කිරීමට අවශ්‍ය තීන්දු තීරණ ගැනීමට සහ ප්‍රදේශයේ මහ ජනතාවගේ ප්‍රශ්න සාකච්ඡා කර විසඳුම් ලබා දීමට සභාව එකතු වන බවද පවසන ලදී.

එමෙන්ම සභාවේ සියලුම කාර්යයන් නිසි ක්‍රමවේදයකට අනුකූලව නිළධාරීන් විසින් මෙහෙයවනු ලබන අතර චෙක්පත්වලට හෝ අත්සන් කිරීම ගරු සභාපතිතුමා විසින් සිදු නොකරන බවද එබැවින් මෙහි කිසිඳු

හොරකමක් දූෂණයක් වංචාවක් සිදු නොවන අතර වසර තුනක් සභාව නොමැති සමයේදී නිළධාරීන් විසින් ලංකාවේ හොඳම පළාත් පාලන ආයතනය ලෙස අප සභාව පවත්වාගෙන ගිය අතර එම කාලයේදී සංවවර්ධන කටයුතු ද නඩත්තු කටයුතුද නිසි ලෙස කරගෙන ගිය බවද එම කාලයේදී ගරු සභිකවරුන්ට මාසිකව ලබා දෙන දීමනාව ඉතිරි වූ බවද පවසන ලදී.

එමෙන්ම පවත්නා රජය මඟින් හා පැවති රජය මඟින් විවිධ සංවර්ධන ව්‍යාපෘති සිදු කරමින් පවතින නමුත් ගමක අතුරු මාර්ග සංවර්ධනය කිරීම කාණු සංවර්ධනය කිරීම ආදිය ඉටු කිරීමට මෙම ලක්ෂ 15 ප්‍රතිපාදන වෙන් කර තිබූ නමුත් සභාව කඩාකප්පල් කිරීමේ අරමුණින් මහජනතාව වෙත ගෙන යන සංවර්ධනයන් අද දින සභාවේදී වැළැක්වූ බැවින් මෙමඟින් ජනතාවට අසාධාරණයක් වූ අතර ලබන සභාවාරයේදී තමන් විසින් ගරු මන්ත්‍රීවරුන්ගේ දීමනා කොවිඩ් මර්ධන කමිටුව වෙනුවෙන් ගරු ආණ්ඩුකාරතුමා වෙත පරිත්‍යාග කිරීම සුදුසු බවට යෝජනාවක් ගෙන එන බවද එහිදී ගරු මන්ත්‍රීවරුන්ගේ ක්‍රියාකලාපය හඳුනාගත හැකි බව පවසන ලදී. අද දින ගරු සභාව සඳහා සහභාගි වූ ගරු උප සභාපතිතුමා, මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයටත්, මාධ්‍යවේදීන් සියලු දෙනාටත් ස්තුතිය පළ කරමින් ප.ව.3.25 ට පමණ අද දින සභාවේ වැඩ කටයුතු අවසන් විය.

චමික ජයමිණි විමලසේන,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.